“සුබ්හානල්ලාහ් ! (අල්ලාහ් අති පිවිතුරුය.) සැබැවින්ම මුඃමින්වරයෙකු අපිරිසිදු නො වන්නේය” යැයි පැවසූහ

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ එතුමාව මදීනාවෙහි එක් වීදියක දී මුණ ගැසුණහ. එවිට ඔහු ජනාබත් තත්ත්වයේ පසු වූ බැවින් ඔහු එතුමාණන්ගෙන් සෙමින් ඈත් වී ගොස්, ස්නානය කර ගත්තේය. එවිට එතුමාණෝ ඔහුව සොයන්නට වූහ. ඔහු එතුමාණන් වෙත පැමිණි කල්හි, එතුමාණෝ: “ඕ අබූ හුරෙයිරා!” ඔබ කොහේ සිටියේ දැ?”යි විමසූහ. "ඕ අල්ලාහ්ගේ දූතයාණනි! ඔබ මා මුණ ගැසුණේ මම ජනාබත් තත්ත්වයේ සිටිය දීය. එහෙයින්, මා ස්නානය කරන තෙක් ඔබ සමග අසුන් ගන්නට මම අකමැති වූයෙමි.’ යැයි කීහ. එවිට අල්ලාහ්ගේ දූතයාණෝ: “සුබ්හානල්ලාහ් ! (අල්ලාහ් අති පිවිතුරුය.) සැබැවින්ම මුඃමින්වරයෙකු අපිරිසිදු නො වන්නේය” යැයි පැවසූහ.
[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ එතුමාව මදීනාවෙහි එක් වීදියක අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාව මුණ ගැසුණහ. එවිට අබූ හුරෙයිරා පසුවූයේ ස්නානය අනිවාර්යය වූ ජනාබත් තත්ත්වයේ ය. තමන් සිටින්නේ නජීස් තත්ත්වයක යැයි සිතා, නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට කරන ගෞරවයක් ලෙස එතුමාණන් සමග වාඩි වී කතා කිරීමට පිළිකුල් කළේය. පසුව එතුමා සෙමින් ගොස්, ස්නානය කර, පසුව නැවත පැමිණ වාඩි විය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ඔහු කොහේ ගියේ දැයි ඔහුගෙන් විමසන්නට වූහ. පසුව ඔහු සිටි තත්ත්වය ගැන ඔහු එතුමාණන්ට දන්වා, ජනාබත් තත්ත්වයේ සිටිය දී එතුමාණන් සමග වාඩි වීමට හෙතෙම පිළිකුල් කළ බව ද දන්වා සිටියේය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පුදුමයට පත්ව මෙසේ පැවසූහ. "සැබැවින්ම මුඃමින්වරයෙකු පිරිසිදු ය. ඔහු ජීවත්ව සිටිය ද, මිය ගිය ද කවර තත්ත්වයක පසු වුව ද ඔහු අපිරිසිදු නො වන්නේය."

http://sunnah.global/hadeeth/si/show/3076